කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

2016/2017 අධ්‍යයන වර්ෂය

ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි තෙවන වසර

පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය - (2018 අගෝස්තු)

ආර්ථිකවිද්‍යාව/සමාජ සංඛ්‍යානය

ECON 41414/SOST 41434 : සංවර්ධන ආර්ථිකවිද්‍යාව

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. "අඩු දියුණු රටවල සිට දියුණු රටවලට සම්පත් සංකේන්ද්‍රණයවීමේ ක්‍රියාවලිය මගින් සිදුවෙමින් පවතින වර්තමාන ලෝක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දෘශ්‍යමාන ප්‍රතිඵලය ඌන සංවර්ධනයේ සංවර්ධනයයි." යන්න පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

(ලකුණු 20)

02. සංවර්ධනය මැනීමේ සාම්ප්‍රදායික මිණුම් මගින් අඩු දියුණු රටවල සංවර්ධන ක්‍රියාවලියේ දැකිය හැකි අන්තර් පරායත්තභාවය සහ අසමානතාව (Interdependency and disparity) හඳුනාගත නොහැකිය. මෙම තත්ත්වය හඳුනාගත හැකි ආකාරය සහ ඉන් මිදීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග මොනවාදැයි විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

03. සමාජ සුභසාධන රාජ්‍ය ප්‍රතිපත්තිය මත පිහිටා සංවර්ධන අභිමතාර්ථ මුදුන්පමුණුවා ගැනීම කෙතෙක්දුරට සාර්ථක වන්නේ ද යන්න ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය හෝ නිදහස් සෞඛ්‍ය යන අංශ දෙකින් එකක් උදාහරණ ලෙස ගෙන විග්‍රහ කරන්න.

(ලකුණු 20)

04. නිවැරදි විද්‍යාත්මක පර්යේෂණ පදනම් කරගත් සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය නොකොට දේශපාලන අවශ්‍යතා මුදුන් පමුණුවා ගැනීමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන විශාල ණය බරක සමාජ පිරිවැයක් දැරීමට ශ්‍රී ලංකාවට සිදු වී ඇත යන්න කෙතෙක්දුරට සාධාරණ ද? උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. අඩු දියුණු රටවල ඉතිරි කිරීම් සහ ආයෝජන අතර පරතරයත්, ආනයන වියදම් සහ අපනයන ආදායම් අතර පරතරයත් නිසා එකී රටවල සංවර්ධනය වේගවත් කිරීමට මහා තල්ලුවක් දිය යුතුව ඇතැයි අදාළ සංවර්ධන ආර්ථික න්‍යායන් මගින් පෙන්වා දී ඇත. මේ පිළිබඳව විවේචනාත්මක විශ්ලේෂණයක් කරන්න.

(ලකුණු 20)

06. සම්භාව්‍ය ආර්ථික වර්ධන ආකෘතියේ විචල්‍යයන්ගේ හැසිරීම අඩු දියුණු රටවල සංවර්ධන ක්‍රියාවලියට යොදා ගැනීමට ඇති සීමාකාරී සාධක වෙනස් කිරීමෙහි ලා ආයතනික විචල්‍යයේ (S විචල්‍ය) ප්‍රමාණාත්මකභාවය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 20)

07. ඒක පුද්ගල ආදායම වර්ධනය සඳහා පුද්ගලයෙකුට හෝ කුටුම්බයකට ඇති විකල්ප අවස්ථා විස්තර කොට අඩු දියුණු රටවල ආර්ථික, දේශපාලන සහ සමාජ සන්දර්භය තුළ ඒක පුද්ගල ආදායම වර්ධනය සඳහා ඇති විභවතාව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතුරින් හතරක් (04) පිළිබඳව සටහන් ලියන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදය, වෙළඳපොල සහ සංවර්ධනය
2. ජනගහන වර්ධනය සහ සංවර්ධනයේ අභියෝග
3. නව ලිබරල්වාදය
4. පරාධීන ධනවාදය සහ සංවර්ධනය
5. සංවර්ධනය සහ පරිසරය දූෂණය
6. හැරඩ් - ඩෝමා වෘද්ධි මාදිළිය
7. අධ්‍යාත්මක සංවර්ධනය, ද්‍රව්‍යාත්මක සංවර්ධනය සහ වෙළඳපොල ආර්ථිකය
8. අධ්‍යාපනය සහ සංවර්ධනය

(එක් කොටසකට ලකුණු 05 බැගින්)